# 12 කාව්‍ය නිර්මාණකරණය

**අත්දැකීම් ඇසුරු කරගෙන සිත තුළ උපන් හැඟීම් කවියකට නැඟීම කාව්‍ය නිර්මාණකරණය යි. ලොව නම රැන්දූ බොහෝ කවියන් තමන්ගේ කවිකම ඇරඹුවේ පාසලේ පන්ති කාමරයෙනි. මේ පාඩම සිසුන් තුළ කාව්‍ය නිර්මාණය කිරීමේ නිපුණතාව වර්ධනය කිරීමේ අරමුණින් සැකසුණකි.**

'ළමා වියේ දී අප දකින ලොව පරිණත වියේ දී අප දකින ලොවට වඩා බොහෝ වෙනස් ය. හිරු මහත් කිරණින් බබළන්නේ ද තණ පිටි අතිමහත් හරිත වර්ණ ඇඟලුම් ලා ගන්නේ ද නිල් අඹර නීලෝදකය සේ නිල් වන්නේ ද සෑම සියලු ජීවියකු ම ඉතා ආශ්චර්යජනක ජීවියකු ලෙස පෙනෙන්නේ ද අපගේ ළමා වියේ දී මිස අන් කවර කලක ද?'

රන් රෝස - ආරියවංශ රණවීර

සාහිත්‍ය නිර්මාණ අතරින් කවිය හෙවත් කාව්‍යයට විශේෂ ස්ථානයක් හිමි වේ. රමණීය අදහස් හා අරුත් දැනවෙන පරිදි කරන භාෂාමය නිර්මාණය කවිය යි. කවි නිර්මාණය කරන්නේ කවියා ය. කවියකු බිහි වීමට හේතු තුනක් බලපාන බව පෙරදිග විචාරකයෝ අදහස් කරති. එනම් ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය හා සතතාභ්‍යාසය යි. ප්‍රතිභාව යනු තමා විඳින අත්දැකීම් ඇසුරෙන් අපූර්ව සිතිවිලි පහළ කර ගැනීමේ හැකියාව යි. ව්‍යුත්පත්තිය යනු කාව්‍ය නිර්මාණකරණය මෙන් ම විවිධ ශාස්ත්‍ර හා විෂය සම්බන්ධ පරිණත අවබෝධය යි. සතතාභ්‍යාසය යනු නිර්මාණකරණයෙහි නිරන්තර ව යෙදෙමින් ලබා ගන්නා ප්‍රාගුණ්‍යය යි.

පුරාණ භාරතයේ විසූ අභිනවගුප්ත නම් පඬිවරයා ප්‍රතිභාව විග්‍රහ කොට ඇත්තේ අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ දක්ෂතාව ලෙස ය. කවියාගේ ප්‍රතිභාව වූ කලි අත්දැකීම් යළි යළිත් සිහි කිරීමෙන් නැත හොත් පරිකල්පනයෙන් පෝෂණය ලබන්නකි. පරිකල්පනය මූලික ක්‍රියා තුනක ඵලයක් සේ විස්තර කෙරේ. එම ක්‍රියා නම් විවිධ සිදුවීම් සිතට කා වැදීම, එම සිදුවීම් ස්මෘතියෙහි ප්‍රතිනිර්මාණය වීම හා එම ස්මෘති සටහන් මගින් නව සංකල්ප බිහි වීම ය. මේ අනුව පසිඳුරන්ට ගොදුරු වන කුඩු මහත් හැම දෙයක් මෙන් ම මනසෙහි පහළ වන අදහස කවියා අතින් විචිත්‍රත්වයට හා අපූර්වත්වයට පත් වෙයි.

මේ අවට පරිසරයේ සුලබ සිදුවීම් දෙකක් කවීන් දෙදෙනකු අතින් විචිත්‍රත්වයට පත් වූ සැටි ය.

ගස      වතු සුදු<br>
වී      පිරිසුදු<br>
පොහොය      නැතුදු<br>
සිල් ගත්      බඳු

කුමාරතුංග මුනිදාස



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

රැන රැන් ඉගිල්ලිලා
කොයිබ ද යන්නේ
රංචු රංචු සමනලයිනි
මේ කොයි යන්නේ
රැන් රැන් ඉගිල්ලිලා
අප මේ යන්නේ
සමනල ගිර මුනි සිරිපා
වඳින්ට යන්නේ

ඩබ්ලියු.ඒ. අබේසිංහ

ඇසූ දුටු දෙයක් හෝ සිතෙහි පහළ වූ අදහසක් හෝ භාෂාව කරමින් පෙර නො ඇසූ නො කී ආකාරයෙන් පැවසීමට හැකියාව ලබන්නේ කවියා සතු පරිකල්පන ශක්තිය හේතුවෙනි. කාව්‍යයක වටිනාකම රඳා පවතින්නේ කාව්‍ය වස්තුව මත නො ව, කවියාගේ පරිකල්පනය මත බව ඉංග්‍රීසි කවියකු වන වර්ඩ්ස්වර්ත් පවසා ඇත්තේ එබැවිනි.

කාව්‍ය නිර්මාණයක විශිෂ්ටත්වය සඳහා හේතු වන දෙවන ලක්ෂණය වන්නේ කවියා සතු ව්‍යුත්පත්තියයි. ව්‍යුත්පත්තිය යන්නෙන් අදහස් කෙරෙන්නේ ජීවන තක්සලාවෙන් ලබන පරිණත බුද්ධියත්, ග්‍රන්ථ පරිශීලනයෙන් ලබන බහුශ්‍රැතභාවය නැත හොත් බහු පඨිතතාවත් ය. ව්‍යුත්පත්තියෙන් හීන වූවකුගෙන් පාඨකයාගේ කල්පනා ශක්තිය පුබුදුවා ලන අන්දමේ උසස් නිර්මාණයක් අපේක්ෂා කළ නොහැකි ය.

ඉහත ලක්ෂණ දෙකට අමතර ව කාව්‍ය නිර්මාණයෙහි දී තිබිය යුතු ඊ ළඟ ලක්ෂණය වනුයේ සතතාභ්‍යාසය යි. කවිත්වය නිරායාසයෙන් පහළ වන්නක් නොවේ. නිරතුරු ව පුරුදු පුහුණු කිරීමෙන් සකසා ගත යුත්තකි. සතතාභ්‍යාසය යන්නෙහි අරුත ද එය යි. සංගීතඥයා සිය තූර්ය භාණ්ඩ නිතර නිතර වාදනය කරමින් සිය කලාව ප්‍රගුණ කරන්නාක් මෙන් කවියා ද නැවත නැවත නිර්මාණකරණයේ යෙදිය යුතු ය.

"ඉතා අගනා නිර්මාණයන් ලොවට දුන් කවීන් සිය කවි ලිව්වේ කෙසේ ද? ඔවුන් ලොව ඉදිරියේ තැබුවේ තමා පළමු වරට ලියූ කටු සටහන් ද? ඔවුන් වචනයක් කපා ඒ වෙනුවට තව වචනයක් යෙදූ සැටි ද ඒත් නරක යැයි සිතුණොත් තවත් එකක් එතැනට යොදා බැලූ සැටි ද තම ප්‍රයත්නය අසාර්ථක යැයි සිතූ නොයෙක් විට මුළු කවිය ම හමස් පෙට්ටියට දැමූ සැටි ද සාහිත්‍ය ඉතිහාසයෙහි හෙළි වී තිබේ."

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

එක ම තේමාව යටතේ නිර්මිත කවි සිංහල සාහිත්‍යයෙහි දක්නට ලැබේ. 'වැස්ස' එබඳු විෂයයකි. මේ කවීන් කීප දෙනකු වැස්ස ගැන ලියූ කවි පන්තිවලින් උපුටා ගත් කවි කීපයකි.

(1) වලාකුලේ රන් පාටට විදුලි    කොටනවා
ආකාසේ හඬ තළමින් අකුණු    හඬනවා
බිංදු බිංදු මහ පොළොවට වතුර    වැටෙනවා
හෝ ගාමින් අපේ ගමට වැස්සක්    එනවා

**ඩබ්ලියු. ඒ. අබේසිංහ**

(2) වහිනවා වහිනවා වහිනවා    වහිනවා
ගල් ගහන්නා වගේ වතුර කැට    වැටෙනවා
කළු වලා කැලඹෙමින් මුදුන් වී    නැඟෙනවා
අකුණු ගෙඩි ගිගුම් දී විදුලි ඉරි    දුවනවා

**පී.බී. අල්විස් පෙරේරා**

(3) පොළොවට වැටෙන හැම වැහි බිඳුවක ම    පහේ
ගැබ් වුණ සිසිල එයි ඊ තල පරිදි    මෙහේ
ළා අතු රිකිලි, රුක්ගොමු, ලිය මඬුලු    ඉහේ
දැඩි වේදනාවෙන් මිරිකී හඬනු    ඇහේ

**එච්. එම්. කුඩලිගම**

(4) චිචිරි චිරි චිචිරි චිරි උදේ සිට    ඇද හැළෙන
පොද නොකැඩී තෙත බරි ව හිරිකිතෙන්    කිලිපොළන
පාර තොට ගහ කොළ ද වසා ගෙන හැම    අතින
වහින වැහි වහින වැහි නොපායන මුළු    දවස

**ගුණදාස අමරසේකර**

5) සඳ මඬල වසා ගෙන කළු වලාකුළු    ඇදිණ
මුළු ලොව ම ගනඳුරින් පටලවා ගනු    ලැබිණ

මම මගේ කුටිය තුළ ගන අඳුර මැද    වැතිර
අතරමං වී හුනිමි සිහින සිතිවිලි    අතර

සැඩ සුළං වැල් හමා
අකුණු විදුලිය කොටා
මහා වැහි වලාවක් හදිසියෙන් ඇද හැළිණ

මහගම සේකර

කවි ලියන්නට මූලික වන්නේ අත්දැකීම් ය. ඔබ අවට පරිසරයෙහි, ලෝකයෙහි සොබා දහම හා බැඳී අපූර්ව දේ සිදු වෙයි. ඔබ ඒවා සියුම් ව නිරීක්ෂණය කළ යුතු වෙයි; විඳිය යුතු වෙයි. මේ කවියකු එවන් අත්දැකීමක් ලද අයුරුයි.

'හොඳින් අහන් ඉන්න. එක රළ පේළියක් නැග ගෙන ඇවිත් බැහැල ගියාට පස්සෙ ඊ ළඟ රළ පේළිය නැගෙන්න පටන් ගන්න කල් කෙටි විරාමයක් තියෙනවා. ඒ විරාමය අපූරු නිශ්ශබ්දතාවක්. අපේ මිතුරෙක් අපූරු යෝජනාවක් කෙළේ ය. අපි සවන් දී සිටියෙමු. සැබැවින් ම වචන ඉතා ම අඩු කවියක මෙන් දුර්ලභ නිශ්ශබ්දතාවෙන් පිරි මුහුදේත් විරාමය මධුර විය.

අපි වෙරළේ හිඳ සිටියෙමු. සිහිල් වැල්ලෙන් සැදී දිගු පුලිනතලය ඇසින් දැකියැකි දුර ද ඉක්මවා පැතිර තිබිණ. අප හිඳ සිටියා ම නොවේ. වැල්ලෙන් ම තැනූ කොට්ට උඩ හිස තබාගෙන වැතිර සිටියෙමු. දෑත දෙපය මෙන් ම සිත ද නිදහස් විය. දූරකථන රැහැනින් හෝ අප බැඳ ලන්නට කවරකුට වත් නොහැකි වග දැන සිටීම අපට සතුටක් විය.

නිහඬතාවට ද ගොඩබිම නම් වූ කරබා ගෙන සිටින නිශ්චලතාවට ද එරෙහි ව මුහුද කැරලි ගසන්නට අර අඳිමින් සිටියි. මුහුදේ අගක් මුලක් සොයන්නට නොවෙහෙසී මුහුද විඳින්නට අපට ඇරයුමක් ලැබී තිබිණ.

ලස්සන ම අහස හා මතක සිතිවිලි, රත්න ශ්‍රී විජේසිංහ

මහගම සේකර කවියා කාව්‍ය නිර්මාණ සඳහා සිය අත්දැකීම් ලබා ගන්නා ආකාරය දක්වන තැනකි මේ:

"සමහර දාට මම රෑට කාලා මිදුලට ගිහිල්ලා උඩ බලා ගෙන ඉන්නවා. නොයෙක් එළි පෙනෙන්න පුළුවනි. ආකාසේ වලාකුළු දිහා බලා ඉන්න කොට ආකාසේ තාරකා පිරිලා තියෙන රෑක නොයෙක් චමත්කාර හැඟීම් මතු වෙනවා. කුණාටුවක් වගේ වලාකුළු එහාට මෙහාට පා වෙන කොට සිතට නොයෙක් කැලඹිලි හැඟීම් ඇති වෙනවා. මේ හැඟීම් කැලඹිලි ආශ්‍රයෙන් අමුතු අදහස් වස්තු බීජ සිතේ පහළ වෙනවා."

නිර්මාණ පසුබිම, ඒ.වී. සුරවීර

තනිකම පාළුව හා කාන්සිය කවි නිර්මාණය වීමට පසුබිමක් සපයයි. තමන් ආදරය කරන අයගෙන් වෙන් වී සිටින කෙනකු තුළ හටගත් පාළුව ප්‍රකාශ කෙරෙන ජන කවියකි මේ:

ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට
කන්නේ කරවලයි රට හාලේ බතට
බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට
යන්නේ කවදා ද මවුපියො දකින්නට

තමා උපන් රටෙන් බැහැර ව ඈත රටක මහා නගරයක හුදෙකලා වූ පුද්ගලයකුගේ ප්‍රකාශයක් ලෙසින් එන 'හඳ සහ නිව්යෝර්ක් නුවර' කවි පෙළ එහි රචකයා වන මහගම සේකර තමා විසින් ම ලද අත්දැකීමක් අපූර්වාකාරයෙන් පළ කිරීමකි. මේ එම කවි පෙළෙන් ගත් කොටසකි.

"කළු ගැහී තරගයට ඉහළ ගිය
සිමෙන්ති බිත්ති මිසක
ඇසට නිලට
අහසක් ගහක් කොළක්
අවටක් නැත
නිව්යෝර්ක් නම් පුරවර
සියක් මහල් එක් ටැම් ගෙය මුදුනේ
දොර ජනෙල් වසා සිර කළ කාමරයක
ඇඳක් - පුටුවක් - මේසයක්
මම"

බෝඩිම, මහගමසේකර

චිත්‍රයක් - පින්තූරයක් වුව ද කාව්‍ය නිර්මාණය සඳහා අත්දැකීමක් වන බව ගුණදාස අමරසේකරගේ 'දින පොතේ ලියූ කවිය' නම් වූ කවි පෙළ මගින් ප්‍රකාශ වේ. සිය පුතු එවා ඇති ඔහු සතු අන්තිම වස්තුව වූ මුද්ද, ඔරලෝසුව, පෑන සහ ඇඳුම් පොදිය තුරුළු කර ගෙන වැලපෙන මවකගේ ඡායා රූපයක් කවියා ලන්ඩන් නුවර පුවත්පතක පළ වී තිබෙනු දකියි. පහත දැක්වෙන කවියට නිමිත්ත එය වෙයි.

උඹේ මුද්ද අත් ඔරලෝසුව පෑන
ඇයි රත්තරන් පුතුනේ එව්වේ මොට ද
මතක් වෙන්නව ද නැති නම් විකුණගෙන
හාල් තුනපහේ අරගෙන කන්නට ද

ආවර්ජනා, ගුණදාස අමරසේකර

සිතේ තැන්පත් වූ අත්දැකීමක් කවියක් ලෙස බිහි වීමට සැලකිය යුතු කාලයක් ගත විය හැකි ය. විමල් දිසානායකගේ 'මියගිය උවැසිය' නිර්මාණය සඳහා අත්දැකීම ලද හැටි කවියා විස්තර කරන්නේ මෙසේ ය:

"මේ කවි පෙළ ලිවීමේ දී මගේ අරමුණ වුණේ කිසියම් මහලු කාන්තාවක් මිය යෑමත්, ඒ මිය යාම නිසා මා තුළ ඇති වූ අදහසක්, හැඟීමක් ඉදිරිපත් කිරීමයි. මෙය රචනා කිරීමට යම් අත්දැකීමක් තියෙන්නට ඕනෑ. මා කුඩා කාලයේ දී මා හිතන්නෙ වයස අවුරුදු අට, නවය විතර කාලයේ දී ලැබූ අත්දැකීමක් පදනම් කර ගෙනයි මෙය ලියුවේ."

නිර්මාණ පසුබිම - එ. වී. සුරවීර

පිරුවානා පොත් වහන්සෙ
කනප්පුවේ පෙරළී ඇත
මිදුල පුරා වියළුණ කොළ
ඒ මේ අත විසිර තිබේ
මිදුලෙ පහන් පැලේ නිතර
සැලුණු දැල්ල නිවී ගොස් ය
ඉඳහිට ගේ පිළිකන්නේ
බල්ලකු උඩු බුරනු ඇසේ

විමල් දිසානායක

අම්මා අපට ඇති මහාර්ඝ වස්තුවකි. කුඩා දරුවා ද අම්මා ගැන කවි ලියයි. ඒ ඔහුට දැනෙන ගුණ දක්වමිනි. පහත සඳහන් කවියෙන් නිරූපණය වන්නේ අපේ ම අම්මා ය.

මැනලා වී දෙකක් නොලැබී මල්ලකට
දරුවොත් එක්ක මම වැටිලා ඉන්නකොට
අම්මා ඇවිල්ලා හීනෙන් දොරකඩට
ඇහුවා මගෙ පුතේ කිරි ඕනැද උඹට

නිවා තාරකා පියවා ගෙන දෑස
නිදා ඉන්න නගරේ කළුවර රෑක
පිපී මලක් වී ගේ ළඟ සුදු රෝස
මෙසේ ඇයි නගනු අම්මේ මඳහාස?

කටපුරා පුතේ කියනා හඬ අන්න!
දරුවනේ උදේ වෙනකල් නාඬන්න
මට මගේ කඳුළු සීතල විඳගන්න
ඔබ එපා මවුනි ඇහැ පිසදාලන්න

නන්නාඳුනන මෙතුවර තනිවුන අපට
ඉන්නේ කවුද රෑකවරණෙට බැල්මකට
චන්දෝ බිළින්දෝ නාඬා නැළවෙන්න
යම්දෝ හෙට උදේ අපි ආපසු ගමට

වස්සානේ, රත්න ශ්‍රී විජේසිංහ



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

අත්දැකීමක් රසවත් නිර්මාණයක් බවට පත් කිරීමේ දී කවියන් විවිධ ශිල්පීය උපක්‍රම භාවිත කරන බව ද කාව්‍ය මගින් ඔබට වඩාත් පැහැදිලි වනු ඇත. ව්‍යංග්‍යාර්ථවත් වචන, කාව්‍ය ආකෘතිය, රිද්මය, සංකල්ප රූප, සංක්ෂිප්තතාව, වචන යෙදීම ආදි එම උපක්‍රම ඔබට සහජයෙන් ම ලැබෙන දෙයක් නො ව, කවි ලිවීමෙන් ම ප්‍රගුණ කරගත් දේ ය.

අම්මා, තාත්තා, පාසල, උදය, රාත්‍රිය, මුහුදු වෙරළ, ගම ආදි ඔබේ ජීවිතය හා පරිසරය සමග බැඳි විවිධ තේමා ඔස්සේ සිතෙහි උපදින හැඟීම් විරිතකට අනුව හෝ විරිතකින් තොර ව කාව්‍යාත්මක ව ඉදිරිපත් කිරීමට ඔබට ද හැකියාව ඇත. එමගින් ඔබේ අත්දැකීම් සෙස්සන් සමග බෙදා හදා ගැනීමට මෙන් ම ඔබේ හැඟීම් පුබුදුවා ලීමට ද අවස්ථාව ලැබේ.


සිසු දරු දැරියන් වන ඔබ ඇතැම් විට විවිධ දුක් ගැහැටවලින් ද පාළුව, හුදෙකලාව ආදි සිත්හි උපන් හැඟීම්වලින් ද පීඩා විඳිනවා විය හැකි ය. එවන් අවස්ථාවල සිතෙහි ඇති වූ හැඟීම් හා අත්දැකීම් කවියක් බවට පත් කොට සමාජය සමග බෙදා හදා ගැනීමට ඔබට හැකියාව තිබේ. ලොව නම ගත් බොහෝ කවීන් ඒ තත්ත්වයට පත් වූයේ තම දුක් දොම්නස් තමා පමණක් නොවිඳ අන්‍යයන්ගේ ද අත්දැකීමක් බවට පෙරළා ඉදිරිපත් කිරීමෙනි.

## අවබෝධය

1. කාව්‍ය නිර්මාණකරුවා සතු විය යුතු මූලික ලක්ෂණ තුන කුමක් ද?
2. අභිනවගුප්ත 'ප්‍රතිභාව' හඳුන්වා ඇත්තේ කෙසේ ද?
3. කුමාරතුංග මුනිදාස කවියා වතුසුදු ගස සිල් ගත් සෙයින් දැක්වීමට හේතුව කුමක් ද?
4. වැස්ස ගැන ලියා ඇති කාව්‍ය නිර්මාණ රසවත් වීමට හේතු වී ඇති කාව්‍යෝපක්‍රම මොනවා ද?

## ප්‍රායෝගික අභ්‍යාස

1. **හිරු උදාව, කුරුලු ලොව, ගඟ ගලයි යන තේමා අතරින් එකක් ඔස්සේ කවි දෙකක් නිර්මාණය කරන්න.**
2. **ඈත සයුර දෙස බලා ඉන්නා ඔබ තුළ ඇති වන හැඟීම් කවියකට නගන්න.**
3. **ඊ ළඟ පිටුවේ දැක්වෙන සේයාරුව දෙස බැලීමේ දී ඔබ සිතට නැගෙන සිතිවිලි ඇසුරෙන් කවියක් නිර්මාණය කරන්න.**



## මතකයට

බසේ කිලිටිකම නැණ සිලිලෙන් දොවනා
රැසේ සියල්ලන් හට නව පණ පොවනා
දෙසේ අමුතු මිහිරක් සතුටක් වවනා
කෙසේ කිය හැකි ද කිවිඳුගෙ අගය වනා

කමතේ කෙතේ හේනේ තනියට ඉන්නේ
තුසිතේ ඇතේ යන සොම්නස ගෙන දෙන්නේ
දෙනෙතේ සිතේ අමුතු මැ දේ අන්දන්නේ
විපතේ සෙතේ සම කවියා බව දන්නේ

දිනිඳාගේ රුවන් රස් කෙඳි විහිදීම
තරිඳා කරන සොමි කැලුමන් පැතිරීම
බිලඳා තුළැති කෙළි සිනහා ඉඟි පෑම
කවියා නිසා රසවත් වෙයි හැම දාම

ආර්. සරණසේකර


නොමිලේ බෙදා හැරීම සඳහා ය.